ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2568 2025 අප්‍රේල් 12 බක් කළාපය

දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමික ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

“හරක් බලනව ද? සිල් රකිනව ද? ”

“යථා දණ්ඩේන ගෝපාලෝ - ගාවූං පාජේති ගෝචරං
එවං ජරා ච මච්චු ච - ආයුං පාජෙන්ති පාණිනං”

(ධම්ම පදය - දණ්ඩ වග්ග)

සුපින්වතුනි,

“ ගොපල්ලා කෙවිට උපයෝගී කරගෙන ගොදුරු බිමට ගවයන් පමුනුවන්නා සේ, ජරාව හා මරණය දෙක සත්ත්වයන්ගේ ආයුෂය, අවසානය කරා පමුණුවයි.”

විශාඛා මහා උපාසිකාව සමග සිල් සමාදන් වීම සඳහා සැවත් නුවර පූර්වාරාමයට ගිය පන්සියයක් පමණ වූ කාන්තා පිරිසක් අරභයා බුදුහාමුදුරුවෝ මේ ගාථා ධර්මය දේශනා කළා.

විශාඛා මහා උපාසිකාව කියන්නේ බුද්ධ ශාසනයේ අග්‍ර දායිකා තනතුර ලැබූ ආර්ය ශ්‍රාවිකාවක්. එතුමියට වයස අවුරුදු හතේදී අඟුරට හද්දිය නුවරට බුදුරජාණන් වහන්සේ වැඩම කරපු වෙලාවේ තමාගේ පියාගේ පියා

මෙණ්ඩක සිටුතුමා සමඟ ගොස් බණ අසා සෝවාන් ඵලයට පත් වුණා. සැවැත්නුවර මිගාර සිටුවරයාගේ පුතා වූ පුර්ණවර්ධන සමඟ විවාහ වූ එතුමිය බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූර්වාරාමය සාදවා පූජා කළා. අග්‍ර දායිකාව බවට පත්වුණා. මිගාර සිටු පවුල මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවා ගත්තා.

මෙතුමිය එක්තරා පොහොය දවසක තමන් හොඳට දන්නා කියන කාන්තා පිරිසක් කැටුව පූර්වාරාමයට ආවේ ඔවුනුත් මේ ධර්ම මාර්ගයේ පුහුණු කරවන්න හිතාගෙන. එදා පොහොය දවසක් නිසා විශාඛාව ප්‍රමුඛ පන්සීයක් පමණ වූ මේ කාන්තා පිරිස පෙහෙවස් සමාදන් වුණා. මේ පිරිස තමන් කරන මේ ශීල සමාදානය ගැන අවබෝධයක් ඇතුව මේ කටයුත්තේ යෙදෙනවා දැයි දැන ගන්න අවශ්‍ය වුණා.

විශාඛාව වයසක ආච්චි කෙනෙකු ළඟට ගිහින් මෙහෙම ඇහුවා. "ආත්තම්මේ, ඔබ අද දින සිල් සමාදන් වුනේ ඇයි? 'අනේ දුවේ, මං දැන් වල පයයි ගොඩ පයයි මේ වෙලාවේ සීලයක් රැක්කොත් මළාට පස්සේ මට දිව්‍ය ලෝකෙ උපදින්න පුළුවන්. එහේ ඉපදිලා මීට වඩා ලොකු සැපක් විඳින්න පුළුවන්. ඒක නිසයි මං සිල්සමාදන් වුණේ.

"මැදි වයසෙ උපාසක අම්ම කෙනෙකු ළඟට ගිහින් ඔබ අද දින සිල් රකින්නේ කුමක් පිණිසද?" කියා ඇසුවා. "මගේ මහත්තයට භාර්යාවෝ කීප දෙනෙක් ඉන්නවා. (ඒ කාලේ එය සමාජ සම්මතයක්) මං ගෙදර ඉන්නකොට අනෙක් භාර්යාව ගැන මගේ සිතේ ඉරිසියාවක් තරහක් ඇති වෙනවා. ඒ සපත්නිරෝෂයෙන් මිදෙන්න තමයි මං සිල් ගත්තේ" ඇය පිළිතුරු දුන්නා.

ඊළඟට ගියේ අලුත කසාද බැඳපු තරුණ අම්ම කෙනෙකු ළඟට "ඇයි ඔබ සිල් සමාදන් වුණේ?" විශාඛාව ඇසුවා. විවාහ වුණාම පළමුවෙන්ම පිරිමි දරුවෙකු ලැබෙන්න ඕන කියලා සමාජයේ පිළිගැනීමක් තියෙනව. ඒ නිසා මාත් පළමුවෙන්ම පුතකු ලබාගැනීමේ ප්‍රාර්ථනාව ඇතුව තමයි සිල් සමාදන් වුණේ. කියල ඇය උත්තර දුන්නා.

ඔය පිරිසෙ හිටියා වයස අවුරුදු 10, 11, 12, 13 වගේ වයස් වල පසුවන ගැහැණු ළමයින් කිහිප දෙනෙක් විශාඛාව එයින් එක් අයකු ළඟට ගිහින් ඇයි දුව උපෝසථ සීලය සමාදන් වෙන්න හිතුවේ. ? කියල ඇහුවා. "අවුරුදු 16, 17, විතර කෙනෙකුට කසාද බඳින්න ලැබේවා කියල ප්‍රාර්ථනා කරගෙන අපි සිල් රකින්නේ කියලා පොඩි ගැහැණු ළමයි උත්තර දුන්නා. විශාඛාව මේ සියලු විස්තර බුදුහාමුදුරුවෝ ළඟට ගිහින් ප්‍රකාශ කළාම බුදුහාමුදුරුවෝ ඉහත සඳහන් ගාථාව දේශනා කළා. බලන්න පින්වතුනි, මේ හැමෝටම තිබුණෙ ලෞකික ප්‍රර්ථනා. ඒවා ඉටු කරගන්න තමයි එයාලා සිල් රකින්න ගියෙ. නිවන් ලැබීම ගැන, කය සහ වචනය සංවර කර ගැනීම ගැන මෙයාලට හැඟීමක් තිබ්බලම නෑ.

එදා විතරක් නෙවෙයි. අදත් සිල් සමාදන් වන පින්වතුන් අතර ඔය විදියට හිතන අයත් ගොඩක් ඉන්නවා. ඒ අය දන්නේ නැහැ. උපන්දා ඉඳල මොහොතින් මොහොත ජරාවට යනවා කියල. වයස ගත වෙන්න වෙන්න නොයෙක් විදියේ ලෙඩ රෝග හැදෙනවා. වයසත්, ලෙඩ රෝගත් නිසා සත්ත්වයා මරණය කරා ඉක්මනින් ගමන් කරනවා. ජරාව නිසා අපට වයස නතර කරගෙන හැමදාම ළදරු විදියට, ළමා විදියට, තරුණ විදියට ඉන්න බැරි වෙනවා. අප අකමැති වුණත් පැයෙන් පැය, දිනෙන් දින මරණය කරා ගමන් කරන්න සිදුවෙනවා.

බුදුහාමුදුරුවෝ උපෝසථය අනුදැන වදාළේ ඒ දවස තුළ රහත් වහන්සේ නමක් ජීවිතය ගත කරන විදියට තමන්ගේ ජීවිතය ගත කිරීමට පුද්ගලයා හුරු කරවන්නයි. අංග අටකින් යුක්ත පෙහෙවස් විසීම මහත්ඵල මහානිසංස ලැබෙන ක්‍රියාවක් බව අංගුත්තර නිකාය අට්ඨක නිපාතයේ අට්ඨංගුපෝසථ සුත්‍රයේ සඳහන් වෙනවා.

තවත් එක් දවසක විශාඛා උපාසිකාව පූර්වාරාමයට පැමිණි වෙලාවේ බුදුහාමුදුරුවෝ ඇගෙන් ඇසුවා "විශාඛාවෙනි, ඔබ මේ මහ දවල් කොහි යන ගමන්ද? කියල 'ස්වාමිනි, අද පෝය දවසනේ ඒ නිසා අද මා පෙහෙවස් සමාදන් වෙලා ඉන්නවා. කියල විශාඛාව උත්තර දුන්නා. ඒ වෙලාවේ බුදුහාමුදුරුවෝ ඇයට පෙහෙවස් විසීම් තුනක් ගැන දේශනා කළා.

1. ගොපල්ලකු වගේ රකින උපස්ථය:-
ගොපල්ලා උදෙන්ම අවදි වෙලා හරකුන් ටික දක්කාගෙන තණබිම්වලට රැගෙන යනවා. හවසට ආපසු දක්කාගෙන ඇවිත් අයිතිකාරයට භාර දෙනවා. හරකුන් ටික භාර දීලා ගෙදර ගිහින් එයා මෙහෙම කල්පනා කරනවා. "අද හරක් ටික අසවල් තැන තණකොළ වතුර බිව්වා. හෙට අසවල් තැන්වල තණ කාවි. වතුර බෝවි." මේ හැරෙන්න ඔහුට හරකුන්ගෙන් ලබන ප්‍රයෝජනයක් ගැන හිතෙන්නේ නැහැ. ඒ වගේ සමහර අය සිල් සමාදන් වෙලා මෙහෙම හිතනවා. "මං අද මේ මේ දේවල් කෑවා.බීවා. ලබන පෝයටත් සිල් සමාදන් වෙලා හොඳට කන්න බොන්න ඕන" කියල මේ විදියට සිල් රැකීමෙන් මහත්ඵල මහානිසංස ලැබෙන්නේ නැහැ. නිවන අරමුණු කරගෙන සිල් රකින්න ඕන.

II. නිගණ්ඨ උපෝසථය
නිගණ්ඨ නම්වූ ආගමික කණ්ඩායම තම ශ්‍රාවකයන්ට කියනවා "ඔබ සිටින නැනින් හතර වටේට යොදුන් 100ක් දක්වා සිටින ප්‍රාණීන්ට මෛත්‍රී කරන්න. ඔවුන් ඝාතනය නොකරන්න කියල. එතකොට යොදුන් 100න් එහා සිටින සතුන් ගැන මෛත්‍රියක් ඔවුන්ට නැහැ. ඒ වගේම තමා සතු කිසිවකට බැඳීමක් නැති බව සිතන්නට ඔවුන් ශ්‍රාවකයන්ට පුරුදු කරනවා. ඒ ශ්‍රාවකයො පෙහෙවස් සමාදන් වීම අවසන් වී නැවත ගෙදර ගිය විට අර අත්හැරපු දේපල දු දරුවෝ ධනය ආදී සියල්ලක්ම නැවත අල්ලා ගන්නවා. අත්හැරියා. කියල පෙහෙවස් රකින වෙලාවේ කියල තියෙන්නේ බොරුවක් නේද?

අපේ බෞද්ධ පින්වතුනුත් සිල් සමාදන් වෙලා ගෙදර දොර ගැන, අඹුදරුවන් ගැන, අහල පහළ අයගේ ඕපා දූප, දේශපාලනය වගේ දේවල් කථා කරමින්, බණ අහන වෙලාවට වෙන වල් පල් කථා කරමින් ඉන්නවනම් ධර්මය කියන විට සවන් දෙන්නේ නැති නම්, ආහාරපාන ගිජුව අනුභව කරනවා නම්, ඒවා ගැන හිත හිතා ඉන්නව නම් ඔබ රකින්නේ නිගණ්ඨ උපෝසථයක් බව දැන ගන්න.

III. අරිය උපෝසථය:-
සිල් සමාදන් වූ තැනැත්තා තමන්ගේ සිත පිරිසිදු
කර ගැනීමට බුදුගුණ මෙනෙහි කරන්න ඕන. එවිට සිත පැහැදෙනවා. සිත පැහැදෙන කොට ලොකු සතුටක් ඇතිවෙනවා. බුදුගුණ පිළිබඳ ඇතිවන සතුටක් සමග සිතේ තියෙන නරක අදහස් නැතිවෙනවා. බුද්ධ නමැති බ්‍රාහ්මයා සිහි කරමින් පුරුදු කරන නිසා මෙය බ්‍රහ්ම උපෝසථය ලෙස හඳුන්වනවා.

ඊළඟට බුදුන් වදාළ ධර්මයේ ගුණත් ශ්‍රාවක සංඝ රත්නයේ ගුණත් සිහි කරන්න ඕන. තමන් රකින සීලය එකින් එක සිහිපත් කරන්න ඕන. සමාදන් වූ වේලේ පටන් මේ මොහොත දක්වා සීලයේ පිරිසිදු බව මෙනෙහි කරන්න ඕන. දවසක් දෙකක් සිල් සමාදන් වෙලා ප්‍රමාණවත් නැහැ. ඉස්සර වගේ හතර පෝයටම සිල් ගන්න ඕන. පන්සලට එන්න අපහසු දිනවල ගෙදර ඉඳගෙන පෙහෙවස් සමාදන් වෙන්න ඕන. සීලය පාරමිතාවක් බවට පත් කරගන්නේ ඒ විදියටයි.

රටට ලෝකයට පෙන්න නෙමෙයි අවංක චේතනාවෙන් සිල් සමාදන් වෙලා රකින්න ඕන. අටසිල් සමාදන් වීමෙන් විතරක් සෑහීමට පත්වෙන්න එපා. නවංගුපෝසථ සිල්, දස සිල් වැනි ඉහළ සීලයෙන් පමණක් නිවන් දකින්න බැහැ. භාවනා කරන්නන් ඕන. දහම් අසා දහම් පොත් කියවා ධර්ම සාකච්ඡාවලදී ගැටළු තැන නිරවුල් කරගෙන ධර්මඥානය වැඩි කර ගන්නන් කටයුතු කරන්න ඕන. ඒ විදියට සිල් රකින්න ඔබ සැමට අදහස් පහළ වේවා!

සැමට තෙරුඩන් සරණයි!